

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

Funded by
The European Union

# අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට කෙසෙල් වගා කරමු.

## ගුණාත්මක පිළිවෙත්

QUALITY PRACTICES

HIGH DENSITY DOUBLE ROW

06

කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය

# 06. ගුණාත්මක පිළිවෙත්

6.1 කැන ආරක්‍ෂා කිරීම

6.2 කැන් ආවරණය

6.3 මල් පිස දැමීම

6.4 කැනට බාධාවන මොරෙයියන්ගෙන් කැන ආරක්ෂා කර ගැනීම

6.5 කෙසෙල් මුහය ඉවත් කිරීම

6.6 මල් ඇවරි ඉවත් කිරීම



# ගුණාත්මක පිළිවෙත්

අපනයනය ඉලක්ක කරගනිමින් කෙසෙල් නිෂ්පාදනය කිරීමේ දී ආකර්ශනීය කැළැල් රහිත ගුණාත්මක පලතුරක් ලබාගත යුතුය. මේ සඳහා කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය තාක්ෂණික පැකේජයක් වගාකරුවන් සඳහා නිර්දේශ කරනු ලබයි.



**ගුණාත්මක කෙසෙල් කැනක් ලබා ගැනීමට නම්,**

- නිරන්තර ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කළ යුතුය.
- වගාව රෝග පළිබෝධ වලින් තොරව පවත්වා ගෙන යා යුතුය.
- ශාකයට මනා පෝෂණයක් ලබා දිය යුතුය.
- ක්ෂේත්‍රයේ උසස් ජල වහනයක් පැවතිය යුතුය.
- බාහිරින් ගෙනෙන කිසිවක් ගොවිපල තුළ නොතැබිය යුතුය.
- කෙසෙල් වගාවේ භාවිතා කරන උපකරණ ඉතා හොඳින් මුවහත් කර තිබිය යුතුය.



කෙටි අත්ත (Placenta leaf)
පසු පසට නැවීම

## 6.1 කැන ආරක්ෂා කිරීම

පීදුන වහාම කැන ආරක්ෂා කිරීම නිසා කෙටි අත්ත (Placenta leaf) පසු පසට නවා කැනට වන සියළු බාධාවන් ඉවත් කළ යුතුය. මෙහිදී කැන සමඟ ස්පර්ශවන පඬරැල් ඉවත් කළ යුතු අතර ආධාරක ද ස්පර්ශ නොවන ලෙස සැකසීමට වගබලා ගත යුතුය.





වියළි කොළ ස්පර්ශවන කැනක්



අතු සහ ආධාරක ස්පර්ශවන කැනක්



කැනට හානි පැමිණ විය හැකි
ද්‍රව්‍ය ඉවත් කිරීම



උසස් ගුණාත්මයෙන් යුතු, පිරිසිදු කැනක්



## 6.2 කැන් ආවරණය

- කැන පොලිඑතිලීන් කවර වලින් ආවරණය කිරීමෙන් යාන්ත්‍රික ජීව විද්‍යාත්මක හා රසායනික හානි වලින් කැන ආරක්ෂා කිරීමේ හැකියාව ලැබේ.

- ආවරණය තුළ ඉහළ උෂ්ණත්වයක් පවත්වාගෙන යාම තුළින් සිසිලන හානි වළක්වයි. මේ නිසා කැනේ බරද වැඩිවේ.

- කැන් ආවරණය සඳහා ගේජ් 12 - 25 දක්වා ඝනකමින් යුත් නිල් පොලිඑතිලීන් බෑග් යොදා ගැනේ.

- ලා නිල් පාට පොලිඑතිලීන් බෑගය සෙන්ටිමීටර් 90 විශ්කම්භය සහිත අතර දිග සෙන්ටිමීටර් 155 හෝ ඊට වැඩිවිය යුතුය.

- මෙම බෑගයේ සෑම සෙන්ටිමීටර් 7.6 කට වරක් විශ්කම්භය මිලිමීටර් 12.7 ක සිදුරු සෑදිය යුතුය (කුඩා සිදුරු ගණන 320) විය යුතුය.






කැන ආවරණය කිරීම

06

## කැන ආවරණය (Early Bagging)


- කෙසෙල් කැන පීදුන වහාම කැන ආවරණය කළ යුතුය.
- මුහය ඉවත් කිරීමට පෙර කැනට බෑගය යොදා කෙසෙල් කැනේ ඉහළ ආරම්භ වන තැන ඇති කොලරයට ඉහළින් (ගැටයට උඩින්) බෑගය ගැට ගැසිය යුතුය. එමඟින් වර්ෂා ජලය ඇතුලට වීම වළකී.



කෙසෙල් ආවරණ යොදන අවස්ථාව



අධි ගණත්ව දෙපේළි ක්‍රමයට කැන් ආවරණ කළ අවස්ථාව



ආවරණ බෑගයේ වාතාශ්‍ර පිට වීමට හා ඇතුළු වීමට ඇති සිදුරු



ආවරණ යෙදූ බෑගයක ඇතුළත පෙනුම

- භාවිතා කරන ලද නිල් පැහැති පොලිතීන් ක්ෂේත්‍රයෙන් ඉවත් කර ප්‍රතිචක්‍රීකරණය කරන්න.

## 6.3 මල් පිස දැමීම




මල් පිස දැමීම




මල් පිස දැමීමෙන් පසු

- ගුණාත්මක අස්වැන්නක් සඳහා අවස්ථා කීපයකදී පරවෙන මල් ඉවත් කළ යුතු අතර කුඩා ගෙඩි ක්‍රමානුකූලව පිස දැමිය යුතුය.
- කෙසෙල් කැනක් පුදින්නේ ඇවරි යට අතට සිටින ලෙසය.
- ඉහළ ඇවරිවල ඇති කිරි ඊළඟට ඇති මල් ආවරණවලට වැටී පහලට ගලා යාමට නොදී මෙය සිදු කළ යුතුය.
- මල්වලින් කිරි වෑස්සෙන අවස්ථාවේ දී මෙය සිදු නොකළ යුතුය.
- කුඩා කෙසෙල් ගෙඩිවල ඇති පරවුණු මල් ඉවත් කළ යුතු අතර නොඑසේනම් ඒවා පරණ වී කටුවක් මෙන් තදවී ගෙඩිවලට යාන්ත්‍රික හානි සිදුවේ.
- ඇවරියේ මල් යට අතට සිටින විට හා යටින් ඇති පත්‍ර ආවරණය එසේ තිබියදී මල් ඉවත් කිරීමෙන් පහළ ඇවරිවලට කිරි වැටීම නිසා වන හානිය වළක්වා ගත හැකිය.

- කෙසෙල් ඇවරිය උඩු අතට හැරුණුවිට මල් පිස දැමීමෙන් පහළ ඇවරිවල මල් රැඳි ගෙඩිවල කළු තිත් ඇතිවිය හැකිය.



මල් පිස දැමීමට පෙර




මල් පිස දැමූ පසු

- කෙසෙල් කැන වර්ධනය අඛණ්ඩව සිදුවෙමින් ඇවරි ඉහළට නැමීම පටන් ගන්නා විට පර වූ මල් සතිපතා ඉවත් කෙරේ.

## 6.4 කැනට බාධාවන මොරෙයියන්ගෙන් කැන ආරක්ෂා කර ගැනීම

සමහර අවස්ථාවලදී මව්ශාකයේ ඉදිරියේ කැනට යටින් මොරෙයියන් වැඩී සිටින විට (දුව, මිණිපිරී) කැනට බාධා නොවන අයුරින් එම පැළය කැනෙන් ඉවතට ගෙන වියළි කෙසෙල් පට්ටා හෝ ප්ලාස්ටික් පටි භාවිතයෙන් මව් ශාකයට ගැට ගැසිය යුතුය. මෙමඟින් කැන සීරීම්, තැලීම් හා ඝර්ශනයෙන් සිදුවන හානි වළක්වා ගත හැකිය.






කෙසෙල් කැනේ ගුණාත්මක භාවයට බලපා ඇති මොරේයියා













## 6.5 කෙසෙල් මුහය ඉවත් කිරීම (De Budding)

**මෙහිදී බැක්ටීරියා කුණුවීම පැතිරීම වළක්වා ගැනීමටත්, ඉතිරි ඇවරිවල වේගවත් වර්ධනයක් ඇති කර ගැනීමටත්, වෙළඳපොල ඉල්ලුම පරිදි කෙසෙල් ගෙඩිවල දිග වැඩි කර ගැනීමටත් හැකියාව ලැබේ.**

- අවසාන ඇවරි 2 පොළොවට සමාන්තර වන අවස්ථාව මුහය කැඩීමට සුදුසු අවස්ථාවයි.





කෙසෙල් මුහය කඩා ඉවත් කිරීම



## 6.6 මල් ඇවරි කඩා ඉවත් කිරීම (De Budding)

- මෙහිදී අවසාන ඇවරි සම්පූර්ණයෙන් ඉවත් කර ඊළඟ ඇවරියේ එක කෙසෙල් ගෙඩියක් පමණක් ඉතුරුවන සේ ඉතිරි ගෙඩි ඉවත් කිරීම සිදු කරයි.



ඊළඟ ඇවරියේ එක කෙසෙල් ගෙඩියක් පමණක් ඉතුරුවන සේ ඉතිරි ගෙඩි ඉවත් කිරීම

- එක් කෙසෙල් ගෙඩියක් පමණක් ඉතුරු කරන්නේ යම්කිසි රෝගයක් වැළඳුනහොත් එය පළමුව වැළඳෙන්නේ මෙම ඉතිරි කළ කෙසෙල් ගෙඩියට නිසාය. එම රෝගය පහසුවෙන් හඳුනා ගත හැකි වීම මෙහි වාසියයි.



- ඉන්පසු මුහය කඩා ඉවත් කිරීම සිදු කරනු ලබයි.

- ඉන් අනතුරුව කිරි බේරීමට පැයක් පමණ පොළිතීන් කවරය උඩට ඔසවා රඳවා තබනු ලැබේ.





මුහය කඩා ඉවත් කළ පසු කිරි බේරීමට හැරීම





මුහය කඩා ඉවත් කළ පසු

කෙසෙල් වගාවේ යහපත් වගා පිළිවෙත් අනුගමනය කරන අතර වගා ක්ෂේත්‍රය තුළ පැවතිය යුත්තේ ජීවි හෝ අජීවි කෙසෙල් ගස්වල කොටස් පමණක් වීමට වගා බලා ගත යුතුය.

කිසිදු බාහිර ද්‍රව්‍යයක් (පොළිතීන්, කඩදාසි) ක්ෂේත්‍රයේ දමා නොයා යුතුය.

අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට

# කෙසෙල් වගා කරමු.

## ප්‍රකාශන කට්ටලය

1. ඇඹුල් කෙසෙල් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන තාක්ෂණය
2. බිම් සකස් කිරීම
3. පැළ සිටුවීම හා අතුරු බෝග වගාව
4. ජල සම්පාදනය හා පොහොර යෙදීම
5. පඳුරු පාලනය හා ආධාරක සැපයීම
6. ගුණාත්මක පිළිවෙත්
7. ක්ෂේත්‍ර සනීපාරක්ෂාව හා පළිබෝධ පාලනය
8. අස්වනු පුරෝකථනය, නෙළීම හා සැකසීම



අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට

# කෙසෙල් වගා කරමු.

## ගුණාත්මක පිළිවෙත්

QUALITY PRACTICE